3 වන පිටෙන්

ද එක්තරා අන්දමක ගැටළුවකි. එහෙත් පොදු විශ්ව විද්‍යාල ප්‍රජාව පෙන්වන්නේ අධ්‍යාපනය විකිණීමනම් වන ප්‍රාථමික ගැටළුවකි. ඔවුන් ඉගෙන ගන්නා විශ්ව විද්‍යාල ආචාර්යවරු ද ඇතැමෙක් තමන්ගේ වියදමෙන්ද තවෙකෙක් රජයේ ශිෂ්‍යත්ව මගින් ද ගෙවා සිය සුදුසුකම් වැඩි කර ගෙන තිබෙන බව ඔවුන් දන්නේ නැත.ඒ ලෝකයේ දැණුමට මිලක් තිබෙන බැවින්ය.

එසේනම් දැන් මේ මැදිහත්වීම කරන්නේ කා වෙනුවෙන් ද යන්න නැවත සළකා බැලිය යුතුය. රටේ බඳු මුදලෙන් ඉගෙන රජයේ බදු නිදහසෙන් ලක්ෂ 120 ක කාර් ද ගන්නට හැකියාව ඇති පිරිසක් ලක්ෂ 120 ක් ගෙවා සිය වෘත්තියටම පිවිසෙන්නට සූදානම් පිරිසකට එරෙහිව කරන අරගලයකට අනෙකුත් විශ්ව විද්‍යාල ප්‍රජාව දායක වී ඇත. ඊට අමතරව ඔවුන්ට පෞද්ගලිකව ලක්ෂ ගණනක් හම්බ කර ගන්නට අවස්ථාව ඇත.එවැනි තත්ත්වයක සිට කරන සටනක සාධාරණය අපේක්ෂා කරන්නට නම්,අඩුම තරමේ රජයේ වෛද්‍යවරු කිසිවෙක් ඒ සටන වෙනුවෙන් වෘත්තියට පිවිසීමෙන් පසුව ලැබෙන බදු සහන භුක්ති නොවිඳ තමන්ට ඉගෙන ගැනීමට වියදම් කළ ජනතා මුදලට කෘතවේදී වන බව කිව යුතුය.එසේත් නැතිනම් පෞද්ගලික සායනවල ප්‍රතිකාරවලින් වැළකී සිටින බව කිව යුතු වන අතර එසේ යෙදෙන්නේනම් තමන් රජයේ රෝහලක හෝ සායනයකට සහභාගී නොවී පෞද්ගලික අංශයේම සේවය කළ යුතුය යනුවෙන් වෛද්‍ය සංගම් විසින් වෛද්‍යවරුන් වෙත බලපෑමක් කළ යුතුය.

එසේම රජයේ වෛද්‍ය විද්‍යාලයට ඇතුල්වීම සඳහා සයිටමය මෙන් පොදු ලකුණු මට්ටමක් රටටම අදාළ කර ගත යුතුය යනුවෙන් තර්ක කිරීමද එම සංගමයට කළ හැකි ධනාත්මක මැදිහත් වීමකි. දැන් සිදුවන්නේ තිබෙන තත්ත්වයන් යටතේ සයිටමය කපා ඉවත් කර දැමිය යුතුය යන සටන් පාඨයට අමතරව අප ඒ වෙනුවෙන් ජනතා බදු මුදලෙන් වෛද්‍යවරුන් වීමෙන් පසු ලැබෙන මෙන්න මේ දේවල් ප්‍රතික්ෂේප කර එය රටේ සුබ සිද්ධියට යොදවන්න සූදානම් යනුවෙන් නොපැවසීමය.

අපට තියෙන ඔක්කොමත් දීලා තවත් දේ ඕනෑ කියා ද වර්ජනය කරන සංගමයක් තවත් කෙනෙක් ලබා ගන්නා දෙයක් ඔහුට ලබා නොදෙන ලෙස කීමේ දී පුංචි හිරිකිතයක් ඇති වන්නේය.ඒ හිරිකිතය ඉවත් කර ගැනීම සඳහා කළ හැකි මැදිහත්වීම නම් ඒ දේ දිය යුත්තේ මෙසේය කියා ප්‍රමිතියක් සැකසීමය.ඒ සඳහා රජයේ රෝහල් ලබා නොදෙන්නයැයි කීමට වඩා වැදගත් ඒ සඳහා රජයට කරන ගෙවීම වැඩි කරන ලෙස පවසා එයින් රජයේ වෛද්‍ය විද්‍යාලය පෝෂණය කළ හැකි මගක් යෝජනා කිරීමය.

**රටේ බඳු මුදලෙන් ඉගෙන රජයේ බදු නිදහසෙන් ලක්ෂ 120 ක කාර් ද ගන්නට හැකියාව ඇති පිරිසක් ලක්ෂ 120 ක් ගෙවා සිය වෘත්තියටම පිවිසෙන්නට සූදානම් පිරිසකට එරෙහිව කරන අරගලයකට අනෙකුත් විශ්ව විද්‍යාල ප්‍රජාව දායක වී ඇත.**




එසේ නොවනතාක් සටන්පාඨ වලට හිර කර තිබෙන ඔළුවලට නොදැනෙන හිරිකිතයක් විවෘතව මේ දෙස බලා සිටින්නෙකුට දැණෙනු වළක්වන්නට නොහැකිය.තියෙන දේ වලට අමතරව තවත් දේ ඉල්ලා ද වර්ජනය කරන වෛද්‍යවරු වෙනෙකෙක්ගේ අයිතිය සහ හිමිකම කප්පාදුකිරීමට දැඟලීම යම් ම්ලේච්ඡ තත්ත්වයකි.සටන අනෙකාගේ මස් රාත්තල ගැනනම් එය ලබා දෙන පිළිවෙල සකස් කිරීමකට හෝ ඒ සටන රට වෙනුවෙන් වන අවංක හැඟීමකින් නම් ඒ හැඟීම මත ක්‍රියා කර සටන වෙනුවෙන් තමන් අත් හරින්නට සූදානම් වරප්‍රසාද පිළිබඳව ප්‍රකාශයක් තිබිය යුතුය.

ඒ කිසිවක් නැත. දැන් ඇත්තේ හඳ ඉල්ලා හ න පොඩි ළමයෙක්ගේ හැඩීමක්ය. එසේත් නොවන්නේනම් අනෙකාට ඉරිසියාව දැක්වීම ජාතික මට්ටමට ගෙනා බොළඳ වැඩ පිළිවෙළක්ය.

## සන්නස Cartoon by PK




සන්නස
මංගල යෝජනා

මුල් වචන 40 සඳහා
මාසයකට අයකිරීම ඩොලර් 30

පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර
එම ලදු පත සමග
ඔබේ දැන්වීම අපට එවන්න

Account Name - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

සන්නස
බලන්නට ඇති පත්තර අතර කියවන්නට ඇති පත්තරයක්